# මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ප්‍රජා සංවර්ධන නිලධාරි විශේෂ ශ්‍රේණියේ (ජ්‍යෙෂ්ඨ ප්‍රජා සංවර්ධන නිලධාරි) සේවා ව්‍යවස්ථා සංග්‍රහය

**01.** සම්බන්ධ වන ආයතන

| | | | |
|---|---|---|---|
| 1.1 | දෙපාර්තමේන්තුව | යොමු අංකය: CPC/CLG/1/4/5/3 | දිනය: 2015.08.28 |
| 1.2 | අමාත්‍යාංශය | යොමු අංකය: CPC/CMS/01/07/07 | දිනය: 2015.09.29 |
| 1.3 | කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම | යොමු අංකය: DMS/D/පොදු/11-2 | දිනය: 2012.12.19 |
| 1.4 | ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය | යොමු අංකය: CPC/CS/2/3/SM/C(III) | දිනය: 2015.10.14 |
| 1.5 | ජාතික වැටුප් කොමිෂන් සභාවේ නිර්දේශය | යොමු අංකය: NPC/10/71/2/SR | දිනය: 2015.06.30 |
| 1.6 | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය | යොමු අංකය: CPC/PSC/13/02/CLG/CDO පරිපාටි | දිනය: 2015.12.01 |

**02.** පත්කිරීම් බලධරයා : මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමිය විසින් බලය පවරන ලද මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

2.1 ක්‍රියාත්මක වන දිනය : මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමිය විසින් අනුමත කරනු ලබන දිනය වේ.

**03.** සේවා ගණය පිළිබඳ විස්තර

3.1 සේවා ගණය : ආශ්‍රිත නිලධාරි සේවා ගණය

සටහන - 2006.01.01 දිනය වන විට අදාළව පැවති වැටුප මත MN5-2006 A වැටුප් ප්‍රමාණය ලබාදී ඇති ප්‍රජා සංවර්ධන නිලධාරීන්ගේ සේවා ගණය ක්ෂේත්‍රගත/ කාර්යාලගත ලෙසට තවදුරටත් භාවිතා වේ.

3.2 ශ්‍රේණි : ප්‍රජා සංවර්ධන නිලධාරි විශේෂ ශ්‍රේණිය (ජ්‍යෙෂ්ඨ ප්‍රජා සංවර්ධන නිලධාරි)

3.3 පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2016.01.19 ...... දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

**ජ්‍යෙෂ්ඨ ප්‍රජා සංවර්ධන නිලධාරි (විශේෂ ශ්‍රේණිය)**

ජ්‍යෙෂ්ඨ විධායක හා විධායක නිලධාරීන්ගේ කාර්යභාරයට උපස්ථම්භක වන පරිදි එම නිලධාරීන්ගේ අධීක්ෂණයට යටත්ව තනතුරට විශේෂිත කොට පවරාදෙනු ලබන පරිපාලනමය හා අධීක්ෂණමය කාර්යයන් සහ පළාත් පාලන කොමසාරිස් විසින් පවරනු ලබන රාජකාරි ඉටු කිරීම වැනි කාර්යයන් මෙම තනතුරු දරන්නන් හට පැවරේ.

3.4 කාර්යයන් පැවරීම : ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන් කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාව මත ජ්‍යෙෂ්ඨ ප්‍රජා සංවර්ධන නිලධරයකුට දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පවරනු ලැබිය හැකිය.

**04.** තනතුරුවල ස්වභාවය : ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත

**05.** වැටුප්

5.1 වැටුප් කේත අංකය : විශේෂ ශ්‍රේණිය - MN7-2006 A

සටහන - මෙම සේවා ව්‍යවස්ථාව අනුමත කරන දිනය වන විට MN5-2006 A වැටුප හිමිකරගෙන සිටින ප්‍රජා සංවර්ධන නිලධාරීන්ට ඔවුන්ට පෞද්ගලික වන පරිදි MN5-2006 A වැටුප තවදුරටත් හිමි වේ.

5.2 වැටුප් පරිමාණය : විශේෂ ශ්‍රේණිය
රු. 20,030 - 11x365 - 18 x500 - 33,045/=

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර : MN 7 - 2006 A

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු) |
|---|---|---|
| විශේෂ | 07 | 22,220.00 |

**06.** **සේවා ගණයට අයත් තනතුරු:**

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :

| අනුමත තනතුරු නාම | අනුමත ශ්‍රේණි | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ ප්‍රජා සංවර්ධන නිලධාරී | විශේෂ | 03 | ඉහත 3.4 හි කාර්යයන් පැවරී ඇත. |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : ජ්‍යෙෂ්ඨ ප්‍රජා සංවර්ධන නිලධාරී = **03**

**07.** **බඳවා ගැනීමේ ක්‍රමය** :

7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන් :

| ජ්‍යෙෂ්ඨ ප්‍රජා සංවර්ධන නිලධාරී | |
|---|---|
| ධාරාව | ප්‍රතිශතය |
| විවෘත | අදාළ නොවේ |
| සීමිත | අදාළ නොවේ |
| කුසලතා | 100% |

7.2 විවෘත බඳවා ගැනීම : අදාළ නොවේ.

7.3 සීමිත බඳවා ගැනීම : අදාළ නොවේ.

**08.** **කාර්යක්ෂමතා කඩඉම** : අදාළ නොවේ

**09.** **භාෂා ප්‍රවීණතාව**

| භාෂාව | ලබා ගත යුතු ප්‍රවීණතාව |
|---|---|
| රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධරයන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පරිවාස කාලය තුළ ලබා ගත යුතුය. |
| අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හි විධි විධානයන්ට අනුව අදාල මට්ටමේ ප්‍රවීණතාව ලබාගත යුතුය |

**10.** **ශ්‍රේණි උසස් කිරීම්**

**10.1** **I ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීම.**

10.1.1 උසස් කිරීම : කුසලතා පදනමින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත

10.1.1.1 සපුරාලිය යුතු මූලික සුදුසුකම්.

(අ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 යටතේ MN4-2006A වැටුප් කේතය යටතේ වැටුප් ලබන ප්‍රජා සංවර්ධන නිලධාරී තනතුරක වසර 25 ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා ඉන් I ශ්‍රේණියේ වසර 05ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

(ආ) පූර්වාසන්න වසර 05 තුළ වැටුප් වර්ධක 05ක් උපයාගෙන තිබීම.

හෝ

(ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 යටතේ MN-5 2006A වැටුප් කේතය යටතේ වැටුප් ලබන ප්‍රජා සංවර්ධන නිලධාරී තනතුරක වසර 15 ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා ඉන් I ශ්‍රේණියේ වසර 05ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

(ඈ) පූර්වාසන්න වසර 05 තුළ වැටුප් වර්ධක 05ක් උපයාගෙන තිබීම.

10.1.1.2 කායික සුදුසුකම්: සෑම අපේක්ෂකයෙකුම මධ්‍යම පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

10.1.1.3 වෙනත් :

I. මෙම තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

II. උසස්වීම් දිනට පූර්වාසන්න වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

III. අනුමත කාර්යසාධන ඇගයීමේ පරිපාටිය අනුව සුදුසුකම් ලබන දිනට පෙරාතුව වූ වසර පහ (05)ක් තුළ සාමාන්‍ය මට්ටමට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබිය යුතුය.

IV. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත්ව තිබිය යුතුය.

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2016.01.19 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

10.1.2 උසස් කිරීමේ ක්‍රමය : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත අයදුම්කරුවන් ලබාගන්නා ලකුණු ප්‍රමුඛතාවය අනුව පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවට සමාන පිරිසක් බඳවා ගනු ලැබේ.

10.1.2.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය : පවතින පුරප්පාඩු සංඛ්‍යාවට වඩා අයදුම්කරුවන් පෙනී සිටින අවස්ථාවකදී ඒ වෙනුවෙන් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා දීමක් සිදුකර එහිදී ලකුණු ලබා ගැනීමේ ප්‍රමුඛතාවය අනුව පවතින පුරප්පාඩු සඳහා උසස් කෙරේ. ලකුණු ලබාදීමේ ක්‍රමවේදය **පරිශිෂ්ටය 1 හි** ඇතුළත් වේ.

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2016.01.19 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

10.1.2.2 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය මණ්ඩලය පත් කරනු ලබන බලධරයා :
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

10.1.2.3 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය :
මධ්‍යම පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුව තුළ අභ්‍යන්තර නිවේදනයක් මඟින්

**11.** තනතුරුවලට පත් කිරීම් : අදාළ නොවේ.

**12.** අර්ථ නිරූපණ හා නිර්වචන :

12.1 "ආණ්ඩුකාරවරයා" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා වේ.

12.2 " ලේකම්" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වේ.

12.3 "කොමිෂන් සභාව" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවයි.

12.4 " සතුටුදායක සේවා කාලය" යනුවෙන් අදහස් කරනුයේ,

(i) රජයේ නිලධරයකු විසින් කාර්යක්ෂමව හා අනලස්ව රාජකාරි ඉටු කිරීම මගින්ද, සමත්විය යුතුව තිබූ කාර්යක්ෂමතා කඩඉම සමත්වීම මගින්ද, සිදුකළ යුතුව තිබූ පත්වීම් ස්ථිර කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම මගින්ද, එම කාලය තුළදී උපයාගත යුතුව තිබූ සියලුම වැටුප් වර්ධක උපයාගෙන ඇත්තා වූ සහ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු නොකරන ලද්දා වූ කාල සීමාවක් වන්නේය.

(ii) නිලධරයා වෙත ලබාදිය යුතුව තිබූ වාර්ෂික වැටුප් වර්ධක නීත්‍යානුකූල හේතූන් මත අත්හිටුවා, අඩුකොට හෝ විලම්භනය කොට ඇති කාළ පරිච්ඡේදයක් වේ නම් එයද ආයතන සංග්‍රහයේ II කොටසේ වැරදි පිළිබඳව පළමුවැනි උපලේඛනය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදු කර ඇති විටක එම වරද සිදු කරනු ලැබූ දින සිට වසර තුනක කාලයක් ද සහ ආයතන සංග්‍රහයේ II කොටසේ වැරදි පිළිබඳව දෙවන උපලේඛනය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදුකර ඇති විටක එම වරද සිදුකරනු ලැබූ දින සිට එක් වසරක කාලයක්ද සතුටුදායක සේවා කාලය ගණනය කිරීමේදී බැහැර කළ යුතු වන්නේය.

12.3 "සක්‍රීය සේවා කාලය" යනු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙක් සියලුම වැටුප් රහිත කාලපරිච්ඡේදයන් සක්‍රීය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

**13.** **අන්තර්ග්‍රහණ ක්‍රමවේදය.**

මෙම බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින්නන්ට එක් වරක් පමණක් අදාළ වන පරිදි ක්‍රියාත්මක වේ.

මධ්‍යම පළාතේ ප්‍රජා සංවර්ධන නිලධාරී තනතුරේ වසර 20 ක් සපුරා ඇති හා පූර්වාසන්න වසර 05ක අඛණ්ඩ හා සක්‍රීය I ශ්‍රේණියේ සේවා කාලයක් ඇති, එම වසර 05 තුළ සියළුම වැටුප් වර්ධක උපයාගෙන ඇති, I ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම නියමිත පරිදි සමත් හෝ කාර්යක්ෂමතා කඩඉමෙන් නිදහස් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ 6/2006 A හි MN 5 වැටුප හිමිකරගෙන සිටින I ශ්‍රේණියේ ප්‍රජා සංවර්ධන නිලධරයන් ගේ ජ්‍යෙෂ්ඨතාවයේ අනුපිළිවෙලට ජ්‍යෙෂ්ඨ ප්‍රජා සංවර්ධන නිලධාරී තනතුරෙහි පවතින පුරප්පාඩු සංඛ්‍යාවට 2013.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරනු ලැබේ.පවතින පුරප්පාඩු සංඛ්‍යාවට වඩා අයදුම්කරුවන් පෙනී සිටින අවස්ථාවකදී ඒ වෙනුවෙන් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා දීමක් සිදුකර එහිදී ලකුණු ලබා ගැනීමේ ප්‍රමුඛතාවය අනුව පවතින පුරප්පාඩු සඳහා උසස් කෙරේ. ලකුණු ලබාදීමේ ක්‍රමවේදය **පරිශිෂ්ටය 1 හි ඇතුළත් වේ.** කොමිෂන් සභාවේ ලේකම් විසින් ඉල්ලා සිටිනු ලබන අවශ්‍ය ලිපිලේඛන හෝ විස්තර සැපයීමට ආයතන/දෙපාර්තමේන්තු ප්‍රධානීන් කටයුතු කළ යුතුය.

14. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසි සහ රජය/ මධ්‍යම පළාත් සභාව විසින් කලින් කලට පනවනු ලබන නීතිරීති හා රෙගුලාසි අදාළ වේ.

15. මෙම බඳවා ගැනීමේ පරිපාටියෙහි සඳහන් යම් කරුණක් සම්බන්ධයෙන් හෝ පරිපාටියෙහි විධිවිධාන සලසා නොමැති යම් කරුණක් සම්බන්ධයෙන් පැනනගින ගැටළුවකදී මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගරු ආණ්ඩුකාරතුමියගෙන් විමසා ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය පරිදි තීරණය කරනු ලැබේ.

16. මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ප්‍රජා සංවර්ධන නිලධාරි විශේෂ ශ්‍රේණියේ (ජ්‍යෙෂ්ඨ ප්‍රජා සංවර්ධන නිලධාරී ) සේවා ව්‍යවස්ථා සංග්‍රහය 2015 දෙසැම්බර් මස 15 දින රැස්වූ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලදී.

| නම | | අත්සන |
|---|---|---|
| 01. ගාමිණී දසනායක මහතා | (සභාපති) | ........................................ |
| 02. යූ.ඒ. බෝගහපිටිය මහතා | (සාමාජික) | ........................................ |
| 03. පි.පි.එස්.ඒ. දිසානායක මිය | (සාමාජික) | ........................................ |
| 04. වී. නන්දකුමාර් මහතා | (සාමාජික) | ........................................ |
| 05. ඒ.ජේ.එම්.එම්. නිස්තාර් මහතා | (සාමාජික) | ........................................ |

මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය :

අනුමත කරමි/නොකරමි

........................................

සුරංගනී එල්ලාවල

මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර

20.16.01.19...........

**<u>ජ්‍යෙෂ්ඨ ප්‍රජා සංවර්ධන නිලධාරී තනතුරට උසස් කිරීම සඳහා වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය</u>**

| ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු | සමත් ලකුණු |
|---|---|---|
| 1. ජ්‍යෙෂ්ඨතාවය<br>ප්‍රජා සංවර්ධන නිලධාරී I ශ්‍රේණියේ වසර 05ක සේවා කාලය ඉක්මවූ පසු වසරකට ලකුණු 05 බැගින් උපරිම ලකුණු 60 | 60 | |
| 2. කුසලතාවය<br>පූර්වාසන්න වසර 05 සඳහා අදාළ වූ කාර්ය සාධන ඇගයීම් වාර්තා<br>විශිෂ්ඨ බව - එක් වසරකට ලකුණු 3 බැගින්<br>සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළ - එක් වසරකට ලකුණු 2 බැගින්<br>සතුටුදායක - එක් වසරකට ලකුණු 1 බැගින් | 15 | |
| 3. සේවා ගණයේ සේවා කාලය තුළ සේවා ඇගයීම් සඳහා පොදු 230 ආකෘතිය පරිදි ලබාදෙන ප්‍රශංසා සඳහා උපරිම ලකුණු 1 බැගින් | 05 | |
| 4. වෘත්තිය /ක්ෂේත්‍රයට අදාළ වන පාඨමාලා හදාරා තිබීම<br>මාස 03කට නොඅඩු සහතිකපත්‍ර පාඨමාලාවක් සඳහා ලකුණු 02 බැගින්<br>මාස 06කට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා ලකුණු 03 බැගින්<br>පශ්චාත් උපාධි පාඨමාලාවක් සඳහා ලකුණු 05 බැගින් | 10 | |
| 5. ක්ෂේත්‍රයට අදාළව ක්‍රියාත්මක කරන ලද විශේෂ ව්‍යාපෘති හා වෘත්තීය මට්ටමෙන් නිර්මාණශීලීව ක්‍රියාත්මක කළ වැඩසටහන් | 05 | |
| 6. භාෂා ප්‍රවීණතාව<br>පිළිගත් ආයතනයක හදාරන ලද අනෙක් රාජ්‍ය භාෂාවේ සහ සන්ධාන භාෂාවේ ඩිප්ලෝමාවක් සඳහා ලකුණු 02<br>සහතික පත්‍ර පාඨමාලා සඳහා ලකුණු 01<br>කථන හැකියාව සඳහා ලකුණු 02 | 05 | |
| එකතුව | 100 | |

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2016.01.19 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

**<u>මධ්‍යම මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ප්‍රජා සංවර්ධන නිලධාරි විශේෂ ශ්‍රේණියේ (ජ්‍යෙෂ්ඨ ප්‍රජා සංවර්ධන නිලධාරි) තනතුර සඳහා වන ඉල්ලුම් පත්‍රය</u>**

I කොටස - අයදුම්කරු විසින් සම්පූර්ණ කළ යුතුය

1. සේවා ස්ථානය හා ලිපිනය :
...................................................................................................................................................................
.............................................................................................................................

2. අයදුම්කරුගේ සම්පූර්ණ නම :
...................................................................................................................................................................
......................................................................................................................මෙනවිය/මහත්මිය/මහතා

3. (i) උපන්දිනය : ...................................................... (ii) පරිපාටිය ක්‍රියාත්මක වන දිනට වයස.......................
4. දැනට දරන තනතුර : ..............................................
5. පත්වීමේ ස්වභාවය : ..............................................
   5.1 තනතුරට අදාල මුල් පත්වීමේ දිනය හා ලිපියේ අංකය ...........................................................................
   5.2 පත්වීම ස්ථිර කළ දිනය හා ලිපියේ අංකය ..........................................................................
   5.3 වර්ෂ 1994 සිට පරිපාටිය ක්‍රියාත්මක වන දිනය දක්වා කාලය තුල උපාධාධාරීන්ට රැකියා ලබා දීමේ රජයේ ප්‍රතිපත්ති යටතේ පත්වීම් ලැබුවෙක් ද යන්න සඳහන් කරන්න..............................................
   5.4 ඉහත 5.3 පරිදි හැර වෙනත් ආකාරයකින් පත්වීම් ලැබුවන්නම් එහි ස්වභාවය සඳහන් කරන්න
   ...................................................................................................................................

6. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 9/2014 අනුව
   1. වැටුප් පරිමාණය ..................................................
   2. වැටුප් කේත අංකය..................................................

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2016.01.19 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

7. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 අනුව
   1. වැටුප් පරිමාණය ..................................................
   2. වැටුප් කේත අංකය..................................................
   3. 2011.07.31 දිනට
      (අ) වැටුප් තලය රුපියල් ..............................................
      (ආ) වැටුප් පියවර අංකය ..............................................

8. දැනට සිටින තනතුරට බඳවා ගැනීමේ පරිපාටිය අනුව දැනට දරන තනතුරට අවශ්‍ය අවම අධ්‍යාපන සුදුසුකම්
...................................................................................................................................................

9. රාජකාරි විස්තරය (සැකෙවින්)
...................................................................................................................................................................
...............................................................................................................................

10. දැනට සිටින තනතුරට බඳවා ගනු ලැබූ බඳවා ගැනීමේ පරිපාටිය අනුව නියම කර ඇති කාර්යක්ෂමතා කඩඉම් විභාග සමත් වූ දිනයන්

| කාර්යක්ෂමතා කඩඉම් විභාගය | සමත් වූ දිනය |
|---|---|
| 1. ...................................... | ........................ |
| 2. ...................................... | ........................ |
| 3. ...................................... | ........................ |

11. කාලය පිළිබඳ විස්තරය (අවශ්‍ය වේ නම් ඇමුණුමක් භාවිතා කරන්න)

| සිට | දක්වා | තනතුර | ස්ථානය | කාලය (අවුරුදු) |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |

12. ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි.

............................ ...............................

දිනය අයදුම්කරුගේ අත්සන

2 කොටස - ආයතන ප්‍රධානියා විසින්සම්පූර්ණ කළ යුතුයි

13. අයදුම්කරු විසින් 1 සිට 11 දක්වා සඳහන් කර ඇති තොරතුරු නිවැරදි බවට සහතික කරමි. (අදාල වේ නම් ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව විසින් වැටුප සඳහා නිර්දේශ ලබා දුන් ලිපියේ පිටපතක් ද ඉදිරිපත් කරමි.)

............................ ........................................................

දිනය ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව